ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය - 2021

-----------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

---------------

1.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

-------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 99 ඡේදය ප්‍රකාරව රැස් කරන ලද සියළුම ආදායම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් කළ යුතු වුවද, බැඳුම්කර ගිවිසුම් කඩ කළ නිළධාරීන්ගෙන් 2021 වර්ෂය තුළදී අය කර ගෙන තිබුණු රු. 7,126,683 ක් හා එම මුදල් ආයෝජනය කිරීමෙන් ලද පොලී ආදායම රු. 1,129,608 ක් ලෙස මුළු එකතුව රු. 8,256,291 ක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුලත් නොකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 8,256,291 කින් අඩුවෙන් දැක්වේ. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 737 අනුව බැඳුම්කර ගිවිසුම් කඩ කිරීමෙන් අදාළ නිළධාරීන්ගෙන් අයකරගනු ලබන මුදල් ආදායමට ගැනීම පිළිබඳව සඳහනක් නොමැති අතර ලැබෙන මුදල් ආයෝජනය කිරීමට සුදුසුකම් ලත් වියදම් දැරීම පිළිබඳව දක්වා ඇත. ඉදිරියේදී, පොළී ආදායම, ආදායමට ගැනීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී ඉදිකිරීම් නිම කර භාවිතයට ගෙන තිබුණු ගොඩනැගිලි 15 ක මුළු පිරිවැය රු. 593,944,192 ක් ප්‍රාග්ධන ගත කර නොතිබීම හේතුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය හා එදිනට කෙරීගෙන යන වැඩ ඊට සමාන අගයකින් පිළිවෙළින් අඩුවෙන් හා වැඩියෙන් දැක්වුණි. එසේම සමාලෝචිත වර්ෂය සඳහා ගොඩනැගිලි ක්ෂය රු. 12,010,316 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී වර්ෂය තුළ සිදු කළ නිම කිරීම් එම වර්ෂය තුළදීම ප්‍රාග්ධනිත කිරීමටත් ඒ සඳහා අදාළ ක්ෂය වෙන් කිරීම වර්ෂය තුළදීම සිදු කිරීමටත් පියවර ගනු ලබන බව. | ඉදිකිරීම් භාවිතයට ගත හැකි තත්වයට නිම කිරීමෙන් පසු එහි පිරිවැය, වත්කම් ලෙස ගිණුම් ගත කළ යුතු අතර ඊට අදාල ක්ෂය ගණනය කළ යුතුය. |
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට බැඳුම්කර ගිවිසුම් කඩ කිරීම වෙනුවෙන් ආචාර්යවරුන් 03 දෙනෙකුගෙන් අයකරගත යුතු රු. 18,243,844 ක් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | බැඳුම්කර ගිවිසුම කඩ කිරීම වෙනුවෙන් අයකර ගත යුතු සියළුම මුදල් ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට පියවර ගනු ලබන බව. | බැඳුම්කර ගිවිසුම් කඩකිරීම හේතුවෙන් විශ්වවිද්‍යාලයට අය විය යුතු මුදල් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

### 1.5.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | **අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව, 2017 ජනවාරි 01 සිට 2021 දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ නිළධාරීන් 186 දෙනෙකු වෙත ගෙවල් කුලී දීමනා ලෙස එකතුව රු. 54,020,257 ක් ගෙවා තිබුණි. | ගෙවල් කුලී දීමනා ලබා දීම සඳහා අනුමැතිය ලබා ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත 2022 ජනවාරි 12 වන දින ලිපියක් ඉදිරිපත් කර ඇති බව. | ගෙවල් කුලී දීමනා ගෙවීම සඳහා අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාලයට දෛනිකව ඉටුකර ගත යුතු ඉංජිනේරුමය කාර්යයන් නොතිබියදී හා විශ්වවිද්‍යාලයේ අනුමත කාර්යය මණ්ඩලය තුළ නොවූ ඉංජිනේරු තනතුරක් සඳහා 2015 දෙසැම්බර් 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි මාස 06ක කාල පරිච්ඡේදයක් සඳහා රු. 50,000 ක මාසික | එම නිළධාරියා විසින් ව්‍යාපෘති කළමණාකරුට අයත් රාජකාරී සිදු කරනු ලබන අතර එම තනතුර 2017 වර්ෂයේ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අනුමත කාර්ය මණ්ඩලයට අයත් තනතුරක් වේ. ඔහු විසින් ව්‍යාපෘති වල ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය කරන අතර | අනුමත කාර්යය මණ්ඩලයට අයත් තනතුරු සඳහා පමණක් බඳවා ගැනීම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දීමනාවක් ගෙවීමේ පදනම මත ඌව පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ කාර්යාලයේ ප්‍රධාන ඉංජිනේරුවරයෙකු අර්ධ කාලීනව පත්කර තිබුණි. සේවා කාලය අඛණ්ඩව දීර්ඝ කරමින් 2018 ජුනි 01 දින සිට මාසික දීමනාව රු. 75,000 ක් දක්වා වැඩි කර තිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදය සඳහා එකතුව රු.4,650,000 ක මුදලක් ගෙවා තිබුණද නිලධාරියා විසින් මාසිකව ඉටුකළ කාර්යයන් පිළිබඳ වාර්තාවක් විශ්වවිද්‍යාලය සතුව නොතිබුණි. | ඔහුට ගෙවීම් සිදු කරනු ලබනුයේ අදාළ ව්‍යාපෘති වල උපදේශන සේවා සඳහා ඇති මුදලින් බව. | |
| (ඇ) | විශ්වවිද්‍යාලයට අයත් හෙක්ටයාර් 29.805 ක ඉඩම පවරා ගැනීම කඩිනම් කිරීම සඳහා අනුමත කාර්යය මණ්ඩලයට අයත් නොවන 2017 වර්ෂය අවසානයේදී විශ්‍රාමික ඉඩම් කොමසාරිස්වරයකු ඉඩම් අත්පත් කර ගැනීමේ උපදේශක තනතුරට බඳවා ගෙන තිබුණි. 2021 දෙසැම්බර් 31 දින වන විට වසර 4 කට වඩා වැඩි කාලයක් ගතවී තිබුණු නමුත් ඉඩම් පවරා ගැනීමේ කටයුතු නිම කර නොතිබුණු අතර එකතුව රු.2,750,000 ක මුදලක් ඔහු වෙනුවෙන් වැය කර තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය අනුව සුදුසු නිලධාරියෙකු යොදවා ගන්නා ලදි. ඔහු විසින් එම ඉඩම් වල අයිතිය පිළිබඳ විවිධ තොරතුරු රැසක් ගොනු කර ගෙන එම ඉඩම් පවරා ගැනීමේ කටයුතු බොහොමයක් අවසන් අදියර තෙක් ගෙන ගොස් ඇති බව. | අනුමත කාර්යය මණ්ඩලයට අයත් තනතුරු සඳහා පමණක් බඳවා ගැනීම් සිදු කළ යුතුය. |
| (ඈ) | 2010 අප්‍රේල් 23 දිනැති අංක 921 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව ජ්‍යෝෂ්ඨ සහකාර පුස්තකාලාධිපති තනතුර සඳහා පැවතිය යුතු සුදුසුකම් සපුරා නොතිබුණු අයදුම්කරුවෙකු 2018 ජුලි 25 දින සිට එම තනතුර සඳහා බඳවාගෙන එදින සිට 2021 දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී රු.10,072,409 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | ජ්‍යෝෂ්ඨ සහකාර පුස්තකාලාධිපති තනතුරට බඳවා ගැනීම සිදු කරනු ලැබුයේ විධිමත් ලෙස වන අතර ඒ සඳහා අවශ්‍යා විශේෂඥ දැනුම ඇති තේරීම් කමිටුවක් මඟින් අදාළ අයදුම්කරුගේ සුදුසුකම් සලකා බලා නිර්දේශ කර, පාලක සභා අනුමැතිය ලබා දී ඇති බව. | තනතුරට අදාළ සුදුසකම් සපුරා ඇති අයදුම්කරුවන් බඳවා ගැනිම සිදු කළ යුතුය. |

### 1.5.4 අනුචිත ඇගයීම හෝ ඇස්තමේන්තු කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020/2021 වර්ෂය සඳහා විශ්වවිද්‍යාලය වෙත ආරක්ෂක සේවය සපයා ගැනීමේ ප්‍රසම්පාදනයේ දී තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ආරක්ෂක නිලධාරියෙකුගේ දෛනික අවම මූලික වැටුප ගණනය කර ඒ අනුව එක් එක් ලංසු ඇගයීම සිදු නොකර පළමු හා දෙවන අවම ලංසු පදනමකින් තොරව ප්‍රතික්ෂේප කර තිබුණි. තෙවන අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු සමාගම වෙත කොන්ත්‍රාත්තුව පිරිනැමීම නිර්දේශ කර කොන්ත්‍රාත්තුව පිරිනමා තිබීම හේතුවෙන් 2020 ඔක්තෝබර් 01 දින සිට 2022 ජනවාරි 31 දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා රු.2,634,989 ක් ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි. | පළමු අවම ලංසුකරු වැටුප් ගණනය කරන ආකාරය ඉදිරිපත් කර නොතිබූ අතර තාක්ෂණික ඇගයීම් කමිටුවේ ඉල්ලීම හා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත වැටුප ගණනය කරන ආකාරය මෙම ආයතනයෙන් ලබා ගැනීමට කටයුතු කර ඇත. එය ගණනය කරන ආකාරය අදාළ ආයතනය මඟින් 2020 අගෝස්තු 07 දින ලබා දී ඇති අතර එය පදනම් කර ගෙන තාක්ෂණික ඇගයීම් කමිටුව තීරණ ලබා දී ඇත. එම නිසා අවම ලංසුකරු වනුයේ තෙවන අවම ලංසුකරුබව තාක්ෂණික ඇගයීම් කමිටුව තීරණය කර ඇත. ඒ අනුව මූල්‍ය පාඩුවක් විශ්වවිද්‍යාලයට සිදු වී නොමැති බව. | ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී විශ්වවිද්‍යාලයට පාඩුවක් නොවන පරිදි නිවැරදි තීරණ ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | | | |
| | මුදල් රෙගුලාසි 571 | විවිධ ඉදිකිරීම්, සැපයුම් හා සේවා ලබා ගැනීම් සඳහා වූ රැඳවුම් මුදල් වශයෙන් පැවති වර්ෂ 02 ක් ඉක්මවූ රු. 41,848,552 ක් නියාදනය කර නොතිබුණි. | විවිධ ඉදිකිරීම්, සැපයුම් හා සේවා ලබා ගැනීමේදී අතරුදවුම් වශයෙන් රඳවාගෙන තිබුණු වර්ෂ 02 ක් ඉක්මවූ රු. 41,848,552 ක තැන්පතු අදාළ අවසන් බිල් පත්‍ර නිරවුල් වූ පසුව නිදහස් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා ආයතන සංග්‍රහය**<br>----------------- | | | |
| | (i) V පරිච්ඡේදයේ 7.6 ඡේදය | 2021 දෙසැම්බර් 31 දින වන විට බැඳුම්කර ගිවිසුම් කඩ කිරීම් හේතුවෙන් ආචාර්යවරුන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 32,827,523 ක් අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | 2022 වර්ෂය තුල රු. 7,020,196 ක් අයකර ගෙන ඇති අතර ඉතිරි මුදල අයකර ගැනීමට කටයුතු සිදු කරනු ලබන බව. | බැඳුම්කර ගිවිසුම් කඩකිරීමට අදාළ මුදල් අයකර ගැනීමේ ක්‍රමවේදය කාර්යක්ෂම කළ යුතුය. |
| | (ii) X පරිච්ඡේදයේ 1.6.1 ඡේදය, XX පරිච්ඡේදයේ 3.1 ඡේදය හා 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය සඳහා අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍ර මගින් තහවුරු කර නොගෙන සමාලෝචිත වර්ෂය තුළදී වැටුප් හා දීමනා ලෙස රු.627,890,669 ක් ගෙවා තිබුණි. | විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිළධාරීන් සඳහා අත්සන් කිරීමේ ලේඛන හෝ ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා කිරීම සිදු නොවන අතර, අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දේශන සඳහා දෙනු ලබන කාල සටහන් වලට අනුකූලව දේශන කටයුතු පවත්වාගෙන යනු ලැබේ. එම දේශන වාර්තා පදනම් කර ගනිමින් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිළධාරීන් සේවයේ නියුක්ත බවට තහවුරුවක් ලබා ගන්නා බව. | විශ්වවිද්‍යාලය ආයතන සංග්‍රහයට හා චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය හා 2019 ජූලි 25 දිනැති අංක SC&PMU/Grant/19 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තු චක්‍රලේඛය | විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අනුදැනුම හා එකඟතාවය ලබා ගැනීමකින් තොරව දකුණු ආසියාවේ ආර්ථික සංවර්ධනය සහ විශ්වවිද්‍යාල ව්‍යාපාරික සහයෝගීතාව ඉහළ නැංවීම සඳහා තිරසාර සංචාරක ව්‍යාපාරයේ විශිෂ්ඨතා මධ්‍යස්ථානයේ (CESTour) පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා යුරෝපා සංගමයේ උසස් අධ්‍යාපන වැඩසටහන වෙතින් සමාලෝචිත වර්ෂය තුළදී රු. 4,217,177 ක් විශ්වවිද්‍යාලය විසින් සෘජුවම ලබා ගෙන තිබුණි. | එම මුදල් ගිවිසුම ප්‍රකාරව ලබා දී ඇති අතර 2022.06.01 දින UWU/FD/B/2022/09 අංක දරන ලිපිය මඟින් විශ්වවිද්‍යාලය වෙත 2021 වර්ෂය සඳහා සෘජුවම ලද විදේශ ප්‍රදාන පිළිබඳව භාණ්ඩාගාරය වෙත දැනුම් දී ඇති අතර එහි පිටපතක් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙතද යවා ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව විදේශ ප්‍රදාන විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ලබා ගැනීම කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2019 නොවැම්බර් 25 දිනැති අංක 09/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නිල නිවාස හිමිකම සහිත නිලධාරීන්ගේ වැටුපෙන් සියයට 10 ක් අයකළ යුතු වුවත් ඊට පටහැනිව උපකුලපති නිල නිවාස ගාස්තු අයකර නොතිබුණු අතර අනෙකුත් ජ්‍යෙෂ්ඨ කාර්යය මණ්ඩල නිල නිවාසවල පදිංචි නිලධාරීන්ගෙන් මාසිකව රු.2,000 ක් හා නිල නිවාස සංකීර්ණයේ (Studio Apartment) පදිංචි නිලධාරීන්ගෙන් මාසිකව රු.1,000 ක් වැනි ඉතා අඩු කුලියක් අය කර තිබුණි. | උපකුලපතිතුමාගේ නිවස ඔහුගේ පුද්ගලික පරිහරණය සඳහා පමණක් නොව විශ්වවිද්‍යාලය සඳහා පැමිණෙන තානාපතිවරුන්, අනෙකුත් විශ්වවිද්‍යාල වල උපකුලපතිවරුන් හා රාජ්‍ය නායකයන් යන සියළු දෙනාගේ නවාතැන් පහසුකම් වෙනුවෙන්ද වෙන් කර ඇත. 2018 අප්‍රේල් 01 වන දින සිට රජය විසින් නිකුත් කළ “උපයන විට ගෙවීම් බදු” මඟින් ඔවුන් සඳහා ලබා දෙන නිවාස හා වාහන සඳහා බදු මුදලක් අය කරනු ලබන බැවින් 2019 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛ අංක 9/2019 චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු නොකරන ලදි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. රු.142,962,594 අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 31,334,498 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 174,297,092ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ ප්‍රවර්ධන හා ප්‍රාග්ධන ප්‍රදාන වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සේවකයින් 06 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 368,646 ක් වර්ෂයකට වඩා කාලයක සිට හා මිය ගිය සේවකයෙකුගෙන් අයවිය යුතු රු. 163,500 ක ආපදා ණය ශේෂය 2011 වර්ෂයේ සිට අය කර | විවිධ හේතු මත රු. 368,646 ක හිඟ හිටි ණය ශේෂයක් තව දුරටත් අය කර ගත යුතු වේ. මියගිය නිළධාරිනියකගේ හිඟ ආපදා ණය ශේෂය අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට දැනුවත් කරමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන | හිඟ හිටි සේවක ණය මුදල් අය කර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගැනීමට කටයුතු කර නොතිබුණි. | කොමිෂන් සභාව වෙත ලිපි යවා ඇත. නමුත් ඒ සඳහා නිසි ප්‍රතිචාර ලැබී නොමැත. | |
| (ආ) | විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයෙකුට චීනයේ සියාමන් විශ්වවිද්‍යාලයේ (Xiamen University) දර්ශනපති උපාධිය (Ph.D) හැදෑරීම සඳහා 2015 සැප්තැම්බර් 25 සිට 2018 සැප්තැම්බර් 24 දක්වා වසර 03 ක් සඳහා වැටුප් සහිත අධ්‍යයන නිවාඩු හා නිවාඩු අවසන් වන දින සිට 2019 ජූලි 24 දක්වා වැටුප් රහිත අධ්‍යයන නිවාඩු අනුමත කර තිබුණි. එහෙත් එම ආචාර්යවරයාගේ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු සහ ශිෂ්‍යත්වය සඳහා රු.7,191,549 ක් විශ්වවිද්‍යාලය විසින් වැයකර තිබියදී දර්ශනපති උපාධිය සම්පූර්ණ නොකර 2019 ජූලි 11 දින සිට සේවයට වාර්තා කර තිබුණි. | මේ පිළිබඳ විමසීමක් කරමින් 2020 නොවැම්බර් 11 වන දින ලේඛකාධිකාරීතුමාගේ අත්සනින් අදාළ ආචාර්යවරයා යොමු කරන ලද ලිපියට පිළිතුරු වශයෙන් ආචාර්ය උපාධිය නිම කිරීමේ සහතිකය භාර දීමට 2021 දෙසැම්බර් දක්වා කල් ලබා දෙන ලෙස ඉල්ලීම් කර තිබුණි. එම දිනය වන විටත් එය භාරදීමට නොහැකි වුවහොත් ඔහුට බැඳුම්කර උල්ලංඝනය කළ පුද්ගලයෙකු ලෙස සැලකීමට තවදුරටත් තීරණය කරන ලදි. | නියමිත කාලය තුළ ආචාර්ය උපාධිය සම්පූර්ණ නොකළ නිළධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 සැප්තැම්බර් 26 දින සිට උපකුලපතිවරයාගේ පත්වීමේ ලිපිය මඟින් සත්ත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨයේ තාවකාලික සහකාර කථිකාචාර්ය තනතුර සඳහා ආචාර්යවරයෙකු පත් කර තිබුණු අතර 2007 අප්‍රේල් 18 දිනැති උපකුලපතිවරයාගේ පත්වීම් ලිපිය මඟින් 2007 මැයි 01 දින සිට කථිකාචාර්ය (පරිවාස) තනතුර සඳහා පත්වීම් ලබාදී තිබුණි. එම කථිකාචාර්යවරයා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය සඳහා උසස් කිරීම සඳහා අදාල සුදුසුකම් සපුරා නොතිබියදී 2012 අප්‍රේල් 30 දිනදී එම තනතුරට උසස් කිරීම සඳහා කරන ලද ඉල්ලීම සහ අවස්ථා දෙකකදී ඉදිරිපත් කරන ලද අභියාචනා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිතුරු එවා නොතිබියදී හා 2015 ජූලි 14 | 2015.08.26 දිනැති විශ්වවිද්‍යාලීය 103 වන පාලක සභා රැස්වීමේදී ඔහුගේ උසස්වීම සම්බන්ධයෙන් පහත තීරණ ගන්නා ලදි.<br>•2013/1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව ඔහුගේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියට උසස්වීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට යොදා ගත නොහැකි බව හා එම මහතා අවුරුදු දෙකක ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවක් හදාරා ඇති අතර ඔහුගේ පාඨමාලාවේ පර්යේෂණ සංරචකයක්ද අඩංගුව තිබී ඇති බැවින් කොමිෂන් සභා චක්‍රලේඛ 721 හි (1) I කොටසේ අයිතම අංක 7 ට අනුව ඔහු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියට උසස් කිරීමට පාලක සභාව විසින් අනුමැතිය ලබා දී ඇති බව.<br>තවද එම පාලක සභාව මඟින් ඉහත උසස් වීම සම්බන්ධයෙන් | පත් කිරීම් සහ උසස් කිරීම් සඳහා විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දිනැති පාලක සභාවේදී ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පැහැදිලි කිරීම් ලබාගත යුතු බවට තීරණය වී තිබියදීත් උපකුලපතිවරයාගේ 2015 ඔක්තෝබර් 05 දිනැති ලිපිය මඟින් මෙම ආචාර්යවරයා 2012 මැයි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය වෙත උසස් කර තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කිරීමට අවශ්‍ය නොවන බව තීරණය කරන ලදි. | |
| (ආ) | 2007 ජුනි 14 දිනැති උපකුලපතිවරයාගේ පත්වීමේ ලිපිය මඟින් 2007 ජුලි 01 දින සිට කළමනාකරණ පීඨයේ තාවකාලික කථිකාචාර්ය තනතුර සඳහා ආචාර්යවරයෙකු පත්කර තිබුණු අතර පසුව 2008 ජුලි 02 දිනැති උපකුලපතිවරයාගේ පත්වීමේ ලිපිය මඟින් 2008 ජුලි 15 දින සිට කථිකාචාර්ය (පරිවාස) තනතුර සඳහා පත්වීම් ලබා දී තිබුණි. 2019 ජුනි 07 දිනැති උපකුලපතිවරයාගේ ලිපිය මඟින් 2013 ජුලි 15 දින සිට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණියට උසස් වීම් කර තිබුණි. එහෙත් උසස්වීම් ලබා දී වර්ෂ 14 කට අධික කාලයක් ගත වී තිබුණ ද මෙම ආචාර්යවරයා ඉන්දියාවේ බැංගලෝර් විශ්වවිද්‍යාලයෙන් ලබා ගන්නා ලද මූලික උපාධිය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද විශ්වවිද්‍යාලයක්ද යන්න සහ අධ්‍යාපන සුදුසුකම් විගණිත දිනය වූ 2022 ජනවාරි 22 දින දක්වා සනාථ කරගෙන නොතිබුණි. | 2014 අගෝස්තු 08 වන දින පැවති 95 වැනි පාලක සභාව වෙත ඔහුගේ මූලික බඳවා ගැනීම සම්බන්ධව පැවති ගැටළු පිළිබඳ මෙමෝ පත්‍රයක් එවකට මානව සම්පත් අංශයේ සේවය කළ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී විසින් ඉදිරිපත් කර තිබිණි. පසුව ඔහු 2018 දෙසැම්බර් 27 වන දින Dalian විශ්වවිද්‍යාලයේ PhD in Enterprise Management උපාධිය සම්පූර්ණ කර ඇති අතර 2019 පෙබරවාරි 26 වන දින එම උපාධිය තහවුරු කර ගැනීම සඳහා Dalian විශ්වවිද්‍යාලය වෙත ලිපියක් යොමු කොට ඇත. නැවත ඔහු 2019 ජනවාරි 29 වන දින ඔහුගේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) තනතුර සඳහා අයඳුම්පත් යොමුකොට ඇත. ඒ අනුව ඔහුට 2013 ජුලි 15 දින සිට බල පැවැත්වෙන පරිදි ඔහුව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) ධූරයට පත් කරන ලදි. ඒ සඳහා වූ තේරීම් කමිටුව 2019 අප්‍රේල් 24 දින පවත්වා තිබේ. තවද 2020 ඔක්තෝබර් 05 දින ඔහුගේ මූලික උපාධිය තහවුරු කර ගැනීම සඳහා බැංගලූර් විශ්වවිද්‍යාලය වෙත ලිපියක් යොමු කොට ඇත. | බඳවාගැනීම් සහ උසස් කිරීම් සඳහා විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. තවද බඳවා ගෙන මාස 03 ක් ඇතුළත බඳවා ගන්නා ලද නිළධාරීන්ගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් අදාළ ආයතන වෙතින් සනාථ කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඇ) | 2020 හා 2021 වර්ෂ වල උපාධි පාඨමාලා 15 ක් සඳහා සිසුන් 1589 ක් බඳවා ගත යුතුව තිබුණද සිසුන් 1232 දෙනෙකු පමණක් බඳවා ගෙන තිබුණු අතර අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සිසුන් 357 ක් අඩුවෙන් ඇතුළත් කර ගැනීම තුළින් සම්පූර්ණ ධාරිතාවය උපයෝජනය කර | 2020/2021 ශිෂ්‍ය කණ්ඩායම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාලය වෙත ලියාපදිංචිය සඳහා ශිෂ්‍ය ලැයිස්තුව යොමු කළ අතර එම ලැයිස්තු වලට අදාළව ශිෂ්‍යයන් බඳවා ගැනීමට කටයුතු කර ඇත. නමුත් ඇතැම් සිසුන් ලියාපදිංචි නොවූ අතර ලියාපදිංචි වූ සමහරක් සිසුන් ද | අදාළ සැලසුම් අනුව සිසුන් බඳවා ගෙන ශිෂ්‍ය ධාරිතාව පූර්ණ ලෙස උපයෝගී කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගැනීමට විශ්වවිද්‍යාලය අපොහොසත් වී තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපදෙස් මත වෙනත් විශ්වවිද්‍යාල වෙත මාරු වී යවන ලදි. මෙවැනි විවිධ හේතූන් මත විශ්වවිද්‍යාලයේ අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වී ඇත. | |
| (ඇ) | බාහිර නේවාසිකාගාර කුලියට ලබා ගැනීමට අදාළ ටෙන්ඩර් කැඳවීමේදී අදාළ අයදුම් පත්‍රය සමඟ කුලියට ලබා දෙන නිවාස සඳහා මාස 06 ක් ඇතුළත ලබා ගත් තක්සේරු වාර්තාවක් ටෙන්ඩර් පත්‍ර සමඟ ලබා දිය යුතු වුවත් කුලියට ගැනීමට තෝරා ගත් අයදුම්කරුවන්ගේ අයදුම් පත්‍ර 14 ක් සම්බන්ධයෙන් එලෙස තක්සේරු වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. මේ හේතුවෙන් විශ්වවිද්‍යාලය විසින් ලබා ගෙන තිබූ බාහිර නේවාසිකාගාර 14 ක් සඳහා ගෙවනු ලබන මාසික කුලිය සාධාරණ අගයක් වන්නේද යන්න තහවුරු කර ගැනීමට නොහැකි විය. | නිවාස වල කුලිය තක්සේරු වාර්තාවන්ට අනුව සහ එක් සිසුවෙකු සඳහා විශ්වවිද්‍යාලය විසින් ගණනය කරන ලද මුදල හා වඩා ආර්ථික ලාභයක් ඇති නිවාස කුලී පදනම මත ලබා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර ඇත. එසේම මෙම වකවානුවේදී නියමිත වේලාවට තක්සේරු වාර්තා ලබා ගැනීමට නොහැකි වීම නිසාත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද නොකර ඉහත සඳහන් කාල නිර්ණායක මත නිවාස තෝරා ගැනීම සිදු කරන ලදි. | අදාළ ටෙන්ඩර් පටිපාටි අනුව තක්සේරු වාර්තා ලබා ගෙන සාධාරණ අගයක් මත නිවාස කුලියට ගැනීම සිදුකළ යුතුය. |
| (ඉ) | 2004 ඔක්තෝබර් 28 දිනැති අංක 2004/ED/HE/45 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව විශ්වවිද්‍යාලය විසින් නේවාසිකාගාර ඉදිකර නේවාසික පහසුකම් ශිෂ්‍යයන් හට හා නිලධාරීන්හට සැපයිය යුතු බව දන්වා ඇතත් ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කර ගැනීමට හෝ සුදුසු ස්ථාන හඳුනා ගෙන සැලසුම් සකස් කර එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් භාහිර පාර්ශවයන්ගෙන් නොවාසිකාගාර පහසුකම් ලබා ගැනීම සඳහා 2018 ජනවාරි සිට 2022 පෙබරවාරි දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් ලබාගෙන තිබූ එකතුව රු. 153,546,444 ක් ගෙවා තිබුණි. | 2005 වසරේ සිට මූලික වශයෙන් සිසුන් 502දෙනෙකුට නේවාසිකාගාර පහසුකම් ඉදිකර ඇති අතර අනෙක් සිසුන් සඳහා විශ්වවිද්‍යාලය අවටින් නේවාසික පහසුකම් සපයා ගැනීම තුළින් නේවාසික පහසුකම් ලබා දීමට හැකි විය. තවද උපකුලපතිවරුන්ගේ ඉල්ලීම මත නේවාසිකාගාර ඉදි කිරීමට 2015 වසරේ සිට කටයුතු සිදු කරගෙන යනු ලබන අතර ඒ වෙනුවෙන් මේ වන විට අක්කර 12 ක විශ්වවිද්‍යාලය ආසන්නයේ පිහිටි වේවැස්ස වත්ත ඉඩම් පවරා ගැනීමට කටයුතු කර ඇත. කෙසේ වෙතත් ඉඩම ලබා ගත් පසු සිසුන් 2,000 කට පමණ නේවාසිකාගාර පහසුකම් ලබා දීමට විශ්වවිද්‍යාලය අපේක්ෂා කරනු ලබයි. | ප්‍රමාණවත් වන පරිදි නේවාසිකාගාර ඉදි කිරීමට හා අවම පිරිවැයක් යටතේ නේවාසිකාගාර කුලියට ගැනීම සිදුකළ යුතුය. |

### 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 7,827,099 ක්වූ ඌව කර්මාන්ත කේන්ද්‍රීය අරමුදල, උපකුලපති අරමුදල සහ සුභ සාධක අරමුදල් සමාලෝචිත වර්ෂය තුළ දී අරමුදල් පිහිටුවීමේ අරමුණු වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි. | 2020 වර්ෂයේ සිට පැවති COVID ව්‍යාපෘතිය නිසා වසර දෙකක පමණ කාලයක් නියමිත පරිදි විශ්වවිද්‍යාල කටයුතු කරගෙන යාමට හැකියාව නොතිබුණු අතර ඉදිරි වසරේදී එම වැඩසටහන් හා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නෙමු. | අදාළ අරමුදල් පිහිටුවීමේ අරමුණු ළඟා කර ගැනීම වෙනුවෙන් උපයෝජනය කළ යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් ව්‍යාපෘති කළමණාකරු තනතුර සඳහා 2017 සැප්තැම්බර් 24 වන දින පුවත් පත් දැන්වීම් පලකර තිබුණු අතර සුදුසුකම්ලත් එක් අයදුම්කරුවෙකු හෝ අයදුම්පත් ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද 2021 දෙසැම්බර් 31 දින වන විටත් එම තනතුර සඳහා සුදුසු නිළධාරියෙකු බඳවාගෙන නොතිබුණි. | ව්‍යාපෘති කළමණාකරු තනතුර සඳහා ඉදිරියේදී පුවත්පත් දැන්වීමක් පළ කිරීමට නියමිතය. | විශ්වවිද්‍යාලයට අවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පුහුණු වන තාක්ෂණික නිළධාරී II ශ්‍රේණිය “ආ” කාණ්ඩයේ තනතුර සඳහා බඳවා ගැනීම් පටිපාටිය අනුව සුදුසුකම් සපුරා නොමැති නිළධාරිනියකු බඳවා ගෙන 2016 අප්‍රේල් සිට 2020 ඔක්තෝබර් දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් එකතුව රු. 3,108,324 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | • ඇය විසින් ඉදිරිපත් කරන ලද අ.පො.ස උසස් පෙළ ප්‍රතිඵල ලේඛණයෙහි විෂමතාවයක් වන හෙයින් හා පුහුණුවන තාක්ෂණික තනතුරට අදාළව මූලික සුදුසුකම් සපුරා නොමැති බැවින් 156 වන පාලක සභා තීරණය ප්‍රකාරව ඇය සේවයෙන් පහ කරන ලදි.<br>• 2021.03.26 වන දින පැවති 161 වන පාලක සභාව මඟින් තීරණය වූයේ ඇය වෙත මෙතෙක් ලබා දුන් සියළුම වැටුප්, වේතන හා දීමනා නැවත අය කර ගැනීමට කටයුතු කළ යුතු බවයි. ඒ අනුව සහකාර කම්කරු කොමසාරිවරයාට | බඳවාගැනීම් පරිපාටිය අනුව සුදුසුකම් සපුරා ඇති නිළධාරීන් බඳවා ගත යුතු අතර ඔවුන්ගේ අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් නියමිත කාලය තුළ සනාථ කර ගත යුතුය. |

දැනුම් දී ලැබෙන පිළිතුරක් සමඟ අපරාධ විමර්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලෙස දැනුම් දී ඇත.

තවද ඉදිරියේදී බඳවාගනු ලබන සියළුම නිළධාරීන්ගේ අධ්‍යාපන සුදුසුකම් මාස 03 ක් ඇතුළත සනාථ කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා මානව සම්පත් අංශයට උපදෙස් ලබා දී ඇත.